www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# “තනි රටක සමාජවාදය” සහ 1920 ගනන්වල සෝවියට් ආර්ථිකය පිලිබඳ විවාද

## "Socialism in One Country" and the Soviet economic debates of the 1920s

**1 වන කොටස**

**නික් බීම්ස් විසිනි**

**2009 මැයි 04**

*ඕස්ට්‍රේලියාවේ සමාජවාදී සමානතා පක්ෂයේ ජාතික ලේකම්වරයා ද ලෝක සමාජවාදී වෙබ් අඩවියේ ජාත්‍යන්තර කර්තෘ මන්ඩලයේ සාමාජිකයෙකු ද වන නික් බීම්ස් 2007 අගෝස්තුවේ දී ඇමරිකා එක්සත් ජනපදයේ මිචිගන් ප්‍රාන්තයෙහි ඈන් ආබර් හිදී පැවැත්වුනු එක්සත් ජනපද සමාජවාදී සමානතා පක්ෂ ගිම්හාන පාසලේ දී දේශන දෙකක් පැවැත්වී ය. මෙම දේශන, 1920 ගනන්වල දී ආර්ථික ප්‍රතිපත්තිය පිලිබඳව සෝවියට් සංගමය තුල පැන නැගුනු තීරනාත්මක ගැටුම් සමහරක් හා සම්බන්ධ ය. දේශන පැවැත්වීමෙහි ලා පෙලඹවූ එක් කරුනක් වූයේ, 2006 දී ප්‍රකාශයට පත් කල ට්‍රොට්ස්කි නමැති සිය කෘතියෙන් බ්‍රිතාන්‍ය ශාස්ත්‍රඥයෙකු වන ජෙෆ්රි ස්වේන් පෙරට දැමූ විකෘත කිරීම්වලට පිලිතුරු දීමේ අවශ්‍යතාව යි. ඩේවිඩ් නෝර්ත්ගේ ලියොන් ට්‍රොට්ස්කි සහ ඓතිහාසික මුසාකරනය පිලිබඳ පශ්චාත් සෝවියට් ගුරුකුලය යන රචනයෙන් මේ පිලිබඳ තවත් කරුනු දත හැකි ය.*

*පහත පල වන්නේ ස්ටැලින්වාදී “තනි රටක සමාජවාදය” පිලිබඳ න්‍යාය ගැන පැවැත්වූ දේශනයේ පලමු කොටස යි.*

සෝවියට් සංගමයේ ඊනියා ආර්ථික විවාද කූට ප්‍රාප්තියට පත් වූයේ තනි රටේ සමාජවාදය පිලිබඳ ගැටුම තුලිනි. මේ විවාදවල දී පැන නැගි ගැටලු ආර්ථික කාරනාවලට ම සීමා වූයේ යැයි විශ්වාස කිරීම වැරදි ය. සැබවින් ම නම්, ආර්ථික ඉදිරි දර්ශනය පිලිබඳ ගැටලු තුල සියලු අතිමූලික ගැටලු අඩංගු විය: ඒවා නම්, ජාත්‍යන්තර ඉදිරි දර්ශන තක්සේරු කිරීම සහ සමාජවාදී විප්ලවය පිලිබඳ අපේක්ෂා, සෝවියට් සංගමයෙහි කම්කරු පන්තිය සහ ගොවි ජනයා අතර සබඳතා, සමාජවාදී ආර්ථිකයක් ගොඩ නැගීමේ දී වෙලඳ පොලට එදිරිව සැලසුම් සකස් කල යුතු ආකාරය, කර්මාන්තයේ විවිධ අංශ අතර සබඳතාව සහ අවසන් වශයෙන්, එහෙත් කිසි ලෙසකින් වත් අඩු වැදගත්කමක් නොගන්නා, කම්කරු පන්තියේ සංස්කෘතික අභිවර්ධනයට ආර්ථික සංවර්ධනයේ ඇති සබඳතාව සහ මෙම ක්‍රියා දාමයන් පක්ෂ තන්ත්‍රය කෙරෙහි බලපාන ආකාරය යි.

විවිධ ප්‍රවනතාවන් අතර හට ගත් අරගලයේ සෑම අදියරක් ම හැඩ ගැස්වුනේ ඒවා දිග හැරුනු ජාත්‍යන්තර වාතාවරනයේ ස්වභාවයෙනි. එසේ ම, විවිධ ප්‍රවනතාවන් පිලිගත් ආස්ථානයන් තුල ජාත්‍යන්තර සමාජවාදී ව්‍යාපාරයේ වර්ධනය කෙරෙහි බලපාන දැවැන්ත ඇඟවුම් ගැබ්ව තිබින.

කිසි ම පාර්ශ්වයක් කල් තබා පිලියෙල කර ගත් සැලැස්මක් සහිතව සෝවියට් සංගමයේ ආර්ථික වර්ධනය පිලිබඳ අරගලයට නොපිවිසුනි. මේ ඉතිහාසය සමාලෝචනය කිරීමේ දී සැලකිල්ලට ගත යුතු පලමු කරුන එය යි. සත්තකින් ම, සතුරු ධනපති රාජ්‍යවලින් වට කරන ලදුව හුදෙකලා වූ කම්කරු රාජ්‍යයක ආර්ථික ඉදිරි දර්ශනයක් පිලිබඳව සාකච්ඡාවක් ඇති වෙතැයි කිසිවෙකුත් කලින් සිතා නොතිබුනු නිසා එවැනි සැලැස්මක් තිබෙන්නට නැත. ප්‍රධාන යුරෝපා රටවල් එකක හෝ කීපයක වත් කම්කරු පන්තිය ජය නොගෙන විප්ලවයට යම් කාලයක් තිස්සේ නොනැසී පැවතිය හැකි යැයි කිසිවෙක් විශ්වාස නොකලහ; රුසියාව තුල පමනක් සමාජවාදය ගොඩ නැගීමක් ගැන කිසිවෙකුත් සලකා නොබැලූ බව කියනු කුමට ද?

ට්‍රොට්ස්කිට සහ වාම විරුද්ධ පාර්ශ්වයට එරෙහි අරගලයේ දී ස්ටැලින් සහ ඔහුගේ ආධාරකරුවන් නැවත නැවතත් පල කල එක් අදහසක් වූයේ තනි රටක සමාජවාදය ගොඩ නැගිය නොහැකි නම් විප්ලවය කිරීම මත් භාර ගත්තේ ඇයි ද යන්න යි. දියුනු ධනේශ්වර රටවල කම්කරු පන්තිය බලයට පත් වූයේ ද නැද්ද යන්න නො තකා සෝවියට් සංගමය තුල සමාජවාදය ගොඩ නැගීමට ඇති හැකියාව ප්‍රතික්ෂේප කරන්නේ රුසියානු විප්ලවයේ ඓතිහාසික සුජාත බවට හානි කිරීමට යැයි ඔවුහු කියා සිටියහ.

තර්කය මුලුමනින් ම ව්‍යාජ විය. රුසියානු විප්ලවයේ ඓතිහාසික සුජාත බව පැන නැගුනේ හුදෙකලා සමාජවාදී රුසියාවක් බිහි කිරීමට ඇති හැකියාවෙන් නො ව එය ලෝක සමාජවාදී විප්ලවයේ ආරම්භක වෙඩි මුරය වී ය යන කරුනෙනි. ලෝක ධනවාදී පද්ධතියේ ප්‍රතිවිරෝධතා ශිෂ්ටාචාරය

ම්ලේච්ඡත්වයට ඇද දැමීමට තර්ජනය කරමින් පලමු වන ලෝක යුද්ධය තුල ප්‍රචන්ඩාකාරයෙන් පුපුරා ගියේ ය. ඒවා වර්ධනය වූයේ, කම්කරු පන්ති බලඇනියකට බලයට ඒමට ඇති හැකියාව මුලින් ම දියුනු ධනේශ්වර රටවලින් එකක නො ව පසුගාමී රටක් වූ රුසියාව තුල බලය අත් කර ගැනීමෙන් ප්‍රදර්ශනය වන අයුරිනි. ආයුධ සන්නද්ධ නැගිටීමට තුඩු දුන් කාල පරිච්ඡේදය පුරා ම ලෙනින් අවධාරනය කලේ බලය ගැනීම කම්කරු පන්තියේ වගකීමක් බව යි. ඔහු එසේ අවධාරනය කලේ කම්කරු පන්තියට තනි රටක් තුල සමාජවාදය ගොඩ නැගිය හැකි නිසා නො වේ; යුරෝපා සහ ජාත්‍යන්තර කම්කරු පන්තියට බලය දිනා ගැනීමට මග විවර කරනු පිනිස ය.

යුද්ධයේ දී "තමන්ගේ ම" පාලක පන්තියට සහාය දැක්වීමට පෙල ගැසීමෙන් දෙවන ජාත්‍යන්තරයේ පක්ෂ කම්කරු පන්තිය ද සමාජවාදය පිලිබඳ අරමුන ද පාවා දී තිබුනි. මෙම පාවා දීම හෙලා දැකීම සඳහා සහ දෙවන ජාත්‍යන්තරය හෙලිදරව් කිරීම සඳහා විවේචනය නමැති අවිය යොදා ගත යුතු විය; එපමනක් නො වේ, සැබවින් බලය අත් කර ගැනීමේ දී අවිය නමැති විවේචනය වෙනුවෙන් එය අත් හැරීම ද කල යුතු විය.



රෝසා ලක්සම්බර්ග්

ජර්මානු විප්ලවවාදිනියක වූ රෝසා ලක්සම්බර්ග් බොල්ශෙවිකයන්ගේ ඇතැම් ප්‍රතිපත්තිමය තීන්දු පිලිබඳව මුලුමනින් ම විවේචනාත්මක විය; එහෙත් විප්ලවයේ අර්ථභාරී බව කල් පවතින්නේ ය යන්න ගැන නම් ඇයට කිසිදු සැකයක් නො වී ය. "බොල්ශෙවිකයන් සිය ප්‍රතිපත්තිය සහමුලින් ම ලෝක කම්කරු පන්ති විප්ලවය මත පදනම් කොට ඇතැ"යි යන ඇයගේ ප්‍රකාශය තුල ගැබ් වන්නේ ඒ නිසැක භාවය යි. ඇය එම ප්‍රකාශය සමාප්ත කලේ මෙසේ ය: "ලෝක කම්කරු පන්තියට ආදර්ශයක් ලෙස පෙරටුව ගිය" පලමු වැන්නෝ ඔවුහු ය, එනම් ලෙනින් සහ ට්‍රොට්ස්කි ය; "අදටත්, 'මා අභියෝග කර ඇතැ'යි හටන් (Hutten) සමග එක්ව කෑ මොර දිය හැකි වන්නේ ඔවුන්ට ම පමනකි. බොල්ශෙවික් ප්‍රතිපත්තිය තුල ගැබ් වන නො වෙන් කල හැකි වූත් තිරසර වූත් ලක්ෂනය එය යි. දේශපාලන බලය දිනා ගනිමින් සහ සමාජවාදය සාක්ෂාත් කර ගැනීමේ ගැටලුව ප්‍රායෝගිකව හඳුනා ගනිමින් ජාත්‍යන්තර කම්කරු පන්තියේ පෙරමුනෙහි ගමන් කරමින් ද මුලු මහත් ලෝකයෙහි ම ප්‍රාග්ධනය සහ ශ්‍රමය අතර පවතින එදිරිවාදීකම නිරාකරනය කිරීමේ කර්තව්‍යය බලගතු ලෙස පෙරට ගෙන යමින් ද ඔවුන් කල සේවය ඓතිහාසිකව අමරනීය වන්නේ ඒ අර්ථයෙනි. රුසියාවේ දී ප්‍රශ්නය මතු කල හැකි වූවා පමනකි. එය රුසියාවේ දී විසඳිය නොහැකි වනු ඇත. මේ අනුව ගත් විට, සෑම තැනක ම අනාගතය අයත් වන්නේ 'බොල්ශෙවික්වාදයට' ය."

අනූ වසරකට පසුව ද එම තක්සේරුව සිය අදාලත්වයෙන් බිඳක් හෝ අහිමි කර ගෙන නැත. මා මේ කරුනු මුල දී ම ඉදිරිපත් කරන්නේ, පසුව පැමිනි සියලු දෑ ද පලමු කම්කරු රාජ්‍යය හුදෙකලා වීමෙන් ඇති වූ දැවැන්ත ගැටලු ද සලකා බලා විප්ලවය ඇති නොවූවා නම් වඩා හොඳ නො වේ දැයි යනුවෙන් පෙරට දැමෙන ආස්ථානයක් ඇතැම් විට අප කන වැකෙන නිසා ය.

අපගේ ව්‍යාපාරයට ඇත්තේ මුලුමනින් ම වෙනස් ඉදිරි දර්ශනයකි. එලඹෙන කාල පරිච්ඡේදයේ දී සිදු වන සමාජවාදී විප්ලවය රුසියානු විප්ලවයට වඩා මුලුමනින් ම වෙනස් ස්වරූපයක් අත් කර ගනු ඇත. එහෙත් ඊට නායකත්වය දෙනු ඇත්තේත් එය සංවිධානය කරනු ඇත්තේත් බලය දිනා ගැනීමට සහ සමාජවාදය ස්ථාපනය කිරීමට ජාත්‍යන්තර කම්කරු පන්තිය දැරූ පලමු ප්‍රයත්නයේ සියලු පාඩම් උකහා ගත් අයවලුන් ය.

බලය දිනා ගැනීමෙන් පසුව බොල්ශෙවිකයන් ක්‍රියාත්මක කල ආරම්භක පියවරයන්ගෙන් ආර්ථිකය සමාජයසතු කිරීම කරා වූ ප්‍රධාන පියවරක් නියෝජනය නො වී ය. පලමු ප්‍රධාන ආර්ථික තීන්දුව වූයේ ඉඩම් ජනසතු කිරීම යි. මෙහි දී විප්ලවවාදී ආන්ඩුව ගොවීන්ගේ පක්ෂයේ "සමාජ විප්ලවවාදී පක්ෂයේ " ක්‍රියා මාර්ගය අනුගමනය කලේ ය. ඉඩම් ජනසතු කල මුත් ගොවීන්ට ඒවා පරිහරනය කිරීමේ අයිතිය තිබින. හරය වශයෙන් ගත් කල්හි, මෙම තීන්දුව ඉඩම් හිමියන්ට එරෙහි ගොවි යුද්ධයෙන් අත් කර ගත් ප්‍රතිඵලවලට එකඟ වනවාට වඩා ටිකක් වැඩි යමක් කලේ ය. ගොවි යුද්ධය විප්ලවවාදී නැගිටීමේ තීරනාත්මක සංරචකයක් විය.

මාක්ස් ග්‍රාමීය ජීවිතයේ මුග්ධ භාවය යැයි හැඳින්වූ දෙය අවසන් කරමින් කෘෂිකාර්මික ක්ෂේත්‍රය තුල කාර්මික නිෂ්පාදන විධික්‍රම විශාල පරිමානයෙන් සංවර්ධනය කිරීම මත පාදක වූ සමාජවාදී වැඩ පිලිවෙල

වර්ධනය කිරීමේ ආස්ථානයෙන් ගත් විට ඉඩම් ප්‍රතිපත්තිය යනු පසුබැසීමක් විය. වඩා දුප්පත් ගොවීන්ට ඉඩම් වෙන් කර දීමත් සමග සමහර වඩා විශාල වතු යායවල් ප්‍රමානයෙන් කුඩා වන්නට විය. ඉඩම් යලි බෙදා හැරීමෙන් දුප්පත් සහ ඉඩම් නොමැති ගොවීන්ට ඉඩම් හිමි වීමත් සමග ඉඩමක් සහිත ගොවි පවුල් සංඛ්‍යාව වැඩි වූ නමුත් භුක්ති විඳි සාමාන්‍ය ඉඩම් ප්‍රමානය පහත වැටින. භුක්ති විඳිය හැකි ඉඩම් ප්‍රමානය පිලිබඳ පොදු ප්‍රතිපත්තියක් හෝ ස්ථාවර තීරනයක් නො වී ය. සෑම ගමක් ම තමන්ගේ ම වැඩ පිලිවෙලවල් සකස් කර ගත් අතර ප්‍රදේශ තුල ද ප්‍රදේශ අතර ද පුලුල් වෙනස්කම් පැවතින.

කර්මාන්ත සම්බන්ධයෙන් ගත් විට, පලමු ප්‍රධාන තීන්දුවලින් එකක් 1917 නොවැම්බර් 21 දා නිකුත් විය. එම තීන්දුව අදාල වූයේ "කම්කරු පාලනයට" ය. එය මේ වන විටත් තාවකාලික ආන්ඩුව යටතේ සමහර බලතල අත් කර ගෙන තිබුනු කම්හල් කමිටුවලට අතිරේක අධිකාරත්වයක් ගෙන දුන්නේ ය. ඒවාට නිෂ්පාදනයේ සහ බෙදා හැරීමේ සියලු ම පැතිකඩවලට ක්‍රියාකාරීව මැදිහත් විය හැකි විය, නිෂ්පාදනය අධීක්ෂනය කිරීමට අයිතිය තිබින, වියදම පිලිබඳ දත්ත ලබා ගැනීමට සහ නිමැවුම සඳහා දර්ශක නියම කිරීමට අයිතිය තිබින. සියලු ගිනුම් වාර්තා සහ ලියකියවිලි ලබා ගත හැකි වන පරිදි සූදානම් කර තැබීමට අයිතිකරුවන්ට සිදු විය. ව්‍යාපාරික රහස්‍ය භාවය අහෝසි කෙරින. [1]

බොල්ශේවිකයන් විප්ලවයට අවතීර්න වූයේ, බැංකු සහ ප්‍රවාහනය හැරුනු විට, සියලු කර්මාන්ත "හෝ අඩු ගනනේ ප්‍රධාන අංශ වත් " ජනසතු කිරීමේ කිසිදු සැලැස්මක් ඇතිව නො වේ.

"බොල්ශේවිකයන්ට රාජ්‍ය බලය දරා සිටිය හැකි ද?" යන මැයෙන් විප්ලවය ආසන්නයෙහි ප්‍රසිද්ධ කල ලිපියක දී ලෙනින් පැහැදිලි කලේ තීරනාත්මක ප්‍රශ්නය වන්නේ දේශපාලන බලය ස්ථාපනය කිරීම බව යි. ආර්ථික ප්‍රතිපත්තිය එම අරමුනට යටත් විය.

"වැදගත් දෙය වන්නේ ධනේශ්වර දේපල රාජ්‍යයසතු කිරීම පවා නො වේ; රට පුරා ද සෑම අංශයක දී ම ද ධනපතියන් සහ ඔවුන්ගේ ආධාරකරුවන් විය හැකි අය මත කම්කරු පාලනය ස්ථාපනය කිරීම යි. රාජ්‍යයසතු කිරීමෙන් ම කිසිදු ප්‍රතිඵලයක් අත් වන්නේ නැත; මන්ද, ඒ තුල සංවිධානය කිරීමේ සහ විධිමත් බෙදා හැරීම පිලිබඳව වගකීමේ මූලිකාංග ඇතුලත් නොවීමය රාජ්‍යයසතු කරනු වෙනුවට, අපට පහසුවෙන් ම සාධාරන බද්දක් පැනවිය හැකි යැ"යි ඔහු ලිවී ය. [2]

1917 දෙසැම්බර් 15 වන දා විප්ලවවාදී ආන්ඩුව ජාතික ආර්ථිකය පිලිබඳ උත්තරීතර මන්ඩලය ස්ථාපනය කලේ ය. එහි කර්තව්‍යය වන්නේ ප්‍රාදේශීය බල මන්ඩල මෙන් ම කම්හල්, වෘත්තීය සමිති සහ කම්කරු පන්ති සංවිධාන සමග සහයෝගීව වැඩ කරමින් ජාතික ආර්ථිකය සහ රාජ්‍ය මූල්‍යය සංවිධානය කිරීම යැයි ප්‍රකාශ කෙරුනි ජනසතු කිරීම ඇරඹෙමින් පැවතුනත් ප්‍රධාන ප්‍රමුඛතාව වූයේ එය නො වේ. බොහෝ අවස්ථාවල එවැනි ජනසතු කිරීම් ක්‍රියාත්මක වූයේ ප්‍රාදේශීය සංවිධානවල මුල පිරීම මත ය. සැබවින් ම, 1918 ජනවාරියේ දී ද යලි අප්‍රේල්වල දී ද, සිය විශේෂ අවසරය නොමැතිව කිසිදු ජනසතු කිරීමක් නො කළ යුතු යැයි උත්තරීතර මන්ඩලය ප්‍රකාශයට පත් කලේ ය; සිය අවසරය නොමැතිව ජනසතු කෙරෙන කිසිදු ව්‍යවසායකට මූල්‍ය පහසුකම් නොලැබෙන බව එය දෙවන අවස්ථාවේ දී ඊට එක් කලේ ය.

1918 ජූනියේ දී තත්ත්වය විස්මිත ලෙස වෙනස් විය. ඒ වන විට පුලුල් පරිමාන ප්‍රාග්ධන අහිමි කිරීමක් සිදු වෙමින් තිබින. මෙම පරිවර්තනය සිදු වූයේ මතවාදයෙහි ඇති වූ වෙනස් වීමක් නිසා නො ව බාහිර තත්ත්වයෙහි ඇති වූ වෙනස් වීමක් නිසා ය. බොහෝ දුරට ම, බොල්ශේවික් ආන්ඩුව පෙරලා දැමීමට මැදිහත් වී එය මුදුන් පමුනුවා ගැනීමට අධිරාජ්‍යවාදී බලවතුන් ගත් තීන්දුව නිසා සිවිල් යුද්ධය ඇවිලින. සිවිල් යුද්ධයෙන් අදහස් වූයේ, විවිධ තත්ත්වයන් යටතේ කම්කරු පාලනයට යටත් වීමට සූදානම්ව සිටි බවක් පෙනී ගියත් ධනේශ්වරය සහ ප්‍රාග්ධන හිමිකරුවන් එසේ යටත් වන්නට සූදානම් නොවීය බලය දිනා ගැනීමෙන් පසුව එලඹුනු පලමු දවසේ පටන් ම ඇමරිකානු කැබිනට්ටුව රුසියාවේ තත්ත්වයත් ඊට මැදිහත් විය හැකි වනු ඇත්තේ කෙසේ ද යන්නත් සාකච්ඡා කරමින් සිටියේ ය. බ්‍රිතාන්‍යයේ දී චර්චිල් තොටිල්ලේ දී ම බොල්ශේවික් ලදරුවාගේ ගෙල මිරිකා දැමීමේ අවශ්‍යතාව ගැන කතා කලේ ය. සාර්වාදී තන්ත්‍රයට නය දී තිබූ ලොකු ම නය හිමියන් වූ ප්‍රන්සයන් තත්ත්වය ආපසු හැරවීමට අධිෂ්ඨාන සහගත වූ අතර ජර්මානු ධනේශ්වරය සහ මිලිටරි ආඥාපතීහු සාමය උදෙසා වූ කොන්දේසිය වශයෙන් රුසියාවේ විශාල ප්‍රදේශයක් ද එහි සම්පත් ද අත් කර ගැනීම සඳහා වූ තම අභිලාශයන් සූත්‍රගත කරමින් සිටියහ.

රුසියාවේ දී මෙය තුඩුදුන්නේ ධනේශ්වරය සිය බලය අහිමි වීම නොපිලිගන්නා තත්ත්වයකටය එය, බාහිර මිතුරන්ගේ සහ හවුල්කරුවන්ගේ සහායෙන් ඉක්මනින් ම ජය ගත හැකි තාවකාලික පසුබැසීමක් විය. ජනසතු කිරීමේ වැඩ පිලිවෙලට දේශපාලනික පෙලඹවීම සැපයුනේ මෙයිනි.

1920 දී ට්‍රොට්ස්කි පැහැදිලි කල පරිදි:

> "බලය අල්ලා ගත් විට, එක් ප්‍රතිඵල කට්ටලයක් කැමති පරිදි පිලිගැනීමටත් අනෙක්වා පිලිගැනීම ප්‍රතික්ෂේප කිරීමටත් නොහැකි ය. බලය යලි තමන් අතට ගැනීමේ අරමුනෙන් යුතුව ධනවාදී

මධ්‍යම පන්තිකයන් දැනුවත්ව සහ සතුරු ලෙස නිෂ්පාදනයේ අසංවිධානාත්මක බව දේශපාලන අරගලයේ විධික්‍රමයක් බවට පරිවර්තනය කර ගත හැකි ය. එවිට දෙන ලද තත්ත්වයේ දී වාසිදායක වන්නේ ද නැද්ද යන්න නො තකා සමාජයසතු කිරීම යොදා ගන්නට කම්කරු පන්තියට සිදු වේ. එමෙන් ම නිෂ්පාදනය පවරා ගත් විට, දැඩි අවශ්‍යතාව නිසා ඇති වන පීඩනය යටතේ, තමන්ගේ ම අත්දැකීමෙන් ඉතා මත් දුෂ්කර කලාවක් ඉගෙනීමට, එනම් සමාජවාදී ආර්ථිකයක් සංවිධානය කිරීමේ කලාව ඉගෙනීමට කම්කරු පන්තියට සිදු වේ. සෑදලයට ගොඩ වූ පසුව සිය ගෙල බිඳී යාමේ අනතුර මැද අසු මෙහෙයවන්නට අසරුවාට සිදු වේ." [3]

දෙවසරක ඇවෑමෙන්, 1922 නොවැම්බරයේ දී පැවැත්වුනු කොමියුනිස්ට් ජාත්‍යන්තරයේ සිව් වන සම්මේලනයට ඉදිරිපත් කල සිය වාර්තාවේ දී ට්‍රොට්ස්කි කර්මාන්ත ජනසතු කිරීම අවශ්‍ය කරවන හේතු තව දුරටත් විස්තාරනය කලේ ය. සිවිල් යුද්ධයක් තුල දී ආර්ථික සංවර්ධනයේ ආස්ථානයෙන් ගැනීමට සිදු වන " පාලම් පුපුරුවා හැරීම වැනි " තීන්දු මුලුමනින් ම අතාර්කික වන නමුත් දේශපාලනික අවශ්‍යතාවක් වන බව ඔහු පැහැදිලි කලේ ය.

ධනේශ්වර දේපල අහිමි කිරීම ක්‍රියාවට නැංවීම කම්කරු රාජ්‍යයට පරිපූර්න ලෙස ම යහපත් වනු ඇත; මන්ද, එවිට ආර්ථිකය නව පදනමක් මත සංවර්ධනය කල හැකි බැවිනි. කෙසේ වෙතත්, 1917-18 දී රුසියාවෙහි පැවති තත්ත්වය එය නො වේ. කම්කරු රාජ්‍යයේ සංවිධානාත්මක ශක්තිය පැවතුනේ පරිපූර්න ජනසතු කිරීමකින් මතු කෙරෙන කර්තව්‍යයන්ට බොහෝ පසුපසින් ගාටන තත්ත්වයක ය. එහෙත් සිවිල් යුද්ධය නිසා ජනසතු කිරීම අවශ්‍යතාවක් බවට පත් විය. ආර්ථික දෘෂ්ටිකෝනයෙන් ගත් විට අතාර්කික වූ පියවරයන් දේශපාලනිකව අවශ්‍ය වූයේ එබැවිනි.


මෙම ආර්ථික අතාර්කිකත්වය උපදවා ලූ ප්‍රධාන සාධකය වූයේ විප්ලවයේ ම ප්‍රතිවිරෝධී ස්වභාවය යි. කම්කරු පන්තිය පලමුව බලයට පත් වූයේ බටහිර යුරෝපයෙහි නො ව රුසියාවෙහි ය. සමාජවාදී විප්ලවය සිදු වූයේ යුරෝපයෙහි ජයග්‍රහනයකින් පසුව නම් වර්ධනයන් අතිශය වෙනස් ස්වරූපයක් අත් කර ගන්නට ඉඩ තිබින. රුසියානු ධනේශ්වරය විප්ලවයට එරෙහිව සුලැඟිල්ලට වඩා බෙහෙවින් වැඩි දෙයක් ඔසවන්නට නිර්භීත නො වී නම් කර්මාන්ත ප්‍රතිසංවිධානය කිරීම සාපේක්ෂ වශයෙන් සන්සුන්ව ක්‍රියාත්මක කල හැකි වන්නට තිබින.

කෙසේ නමුත්, බොල්ශෙවිකයන් මුහුන දුන් තත්ත්වය අතිශයින් ම වෙනස් ය. ලෝකයේ අනෙකුත් කොටස්වල ප්‍රාග්ධනයේ ආධිපත්‍යය පැවති තත්ත්වයක් තුල රුසියානු ධනේශ්වරය විප්ලවය බැරෑරුම්ව ගැනීම ප්‍රතික්ෂේප කලහ.

"විප්ලවවාදී පාලනයේ ආරම්භක තීන්දු සාවඥ සිනාවෙන් යුතුව පිලිගනු ලැබින; ඒවා හෙලා දකිනු ලැබින; ඒවා ක්‍රියාත්මක නොකෙරින. පත්තරකාරයෝ පවා" ඔබට සොයා ගත හැකි බියගුලු ම කන්ඩායමකි "කම්කරු ආන්ඩුවේ විප්ලවවාදී පියවරයන් බැරෑරුම්ව සැලකිල්ලට ගැනීම ප්‍රතික්ෂේප කලහ. ධනේශ්වරයට එය පෙනුනේ විනාශකාරී විහිලුවක්, වැරදි වැටහීමක් ලෙස ය. දේපල රාජ්‍යයසතු කිරීමෙන් තොරව අපගේ ධනේශ්වරයට සහ එහි ගැත්තරයන්ට නව බලයට ගරු කිරීමට උගන්වන්නේ කෙසේ ද? අන් මගක් නො වී ය. සෑම කම්හලක් ම, සෑම බැංකුවක් ම, සෑම පුංචි කාර්යාලයක් ම, සෑම කුඩා වෙලඳ සලක් ම, සෑම නීතිඥ පොරොත්තු කාමරයක් ම අපට එරෙහි බලකොටු බවට පත් විය. ... සංවිධිත ආර්ථික ක්‍රියාකාරකම්වලට අභියෝග කරන්නේ ද නැද්ද යන්න නො තකා සතුරා කුඩු පට්ටම් කර දැමිය යුතු ය; එය පෝෂනය කරන මූලාශ්‍ර ඉවත් කල යුතු ය." [4]

1918 දී ආරම්භ කල දේපල අහිමි කිරීම් ආර්ථික ආස්ථානයෙන් ගත් විට "අතාර්කික" විය. නමුත් එම කරුන ප්‍රයෝජනවත් වන්නේ ලෝකය පාලනය කෙරෙන්නේ ආර්ථික තාර්කික බවෙන් පමනක් නො වේ ය යන්න පෙන්නුම් කිරීමට පමනකි "ඒ එසේ වූයේ නම් ධනේශ්වරය අතුරුදන්ව ගොස් බොහෝ කල් ය" එහෙත් ආර්ථික සහ සාමාජීය ජීවිතයේ රීතිය තුලට යුක්තිය හඳුන්වා දෙනු පිනිස යට කී සමාජ විප්ලවය අවශ්‍ය ය.

1918 දී විප්ලවවාදී ආන්ඩුව මුහුන දුන් බලගතු උත්සුකතාවක් ඇති කල ආර්ථික කර්තව්‍යය වූයේ රුසියාවේ පැරනි පාලක පන්තීන්ට ද ඇමරිකා එක්සත් ජනපදයේ සහ යුරෝපයේ අධිරාජ්‍යවාදී ධනේශ්වරයට ද ... ඕස්ට්‍රේලියාව තරම් ඈත සිට ඇඟිලි ගැසීම් කරන බලවේගයන්ට පවා ද එරෙහිව ඒ වන විට ජීවිතයත් මරනයත් අතර සටනක නියැලී සිටි රතු හමුදාවට අවශ්‍ය ආර්ථික සම්පත් සැපයීම යි. යුද කොමියුනිස්ට්වාදය නමින් ඉතිහාසයට එක් වී ඇති ප්‍රතිපත්තියට මුල් වූයේ එය යි.



ට්‍රොට්ස්කි රතු හමුදාවට සමාචාර කරමින්

යුද කොමියුනිස්ට්වාදයේ කේන්ද්‍රීය පදනම වූයේ රතු හමුදාවට සහ නගරවල ආහාර අවශ්‍යතා සම්පාදනය සඳහා ගොවීන් වෙතින් ධාන්‍ය අතිරික්ත බලෙන් ලබා ගැනීම යි. කර්මාන්ත ප්‍රතිපත්තියට ඇතුලත් වූයේ රාජ්‍ය ව්‍යවසායන් අතර එන්න එන්න ම "ක්‍රමයෙන් නොවටිනා දෙයක් බවට පත් වූ" මුදල් භාවිතයෙන් තොරව සිදු වූ හුවමාරුව යි. ආර්ථික මන්ඩලවල සමස්ත රුසියානු සම්මේලනයේ දෙවන සමුලුවේ යෝජනාවකට අනුව රාජ්‍ය ව්‍යවසායන් ගෙවීමක් නො ලබා සිය නිෂ්පාදන අනෙකුත් රාජ්‍ය ව්‍යවසාන් වෙත බෙදා හල යුතු වූ අතර දුම්රිය හා වෙලඳ නැව් කන්ඩායම් සියලු රාජ්‍ය ව්‍යවසායන්හි නිෂ්පාදන නොමිලේ ප්‍රවාහනය කල යුතු විය. යෝජනාව ප්‍රකාශ කල පරිදි එහි අරමුන වූයේ "ආර්ථික ඒකක අතර සබඳතාව කෙරෙහි මුදලෙන් ඇති විය හැකි සියලු බලපෑම් මුලිනුපුටා දැමීම" යි. [5]

ආර්ථිකයේ රාජ්‍ය අංශය තුල දී මුදලට සිය ක්‍රියාකාරිත්වය අහිමි විය; සැබවින් ම එය කිසි ම කාර්ය භාරයක් ඉටු කලේ නැත. ලමයෙකු සැලකිය යුතු මුහුනත වටිනාකමකින් යුත් මුදල් නෝට්ටුවක් හිඟන්නෙකු වෙත දිගු කලේ එය වටිනාකමක් නැති දෙයක් බව කියවා ගන්නට ම යැයි සෝවියට් රුසියාවේ ආර්ථික ඉතිහාසඥයෙකු වන ඇලෙක් නෝව් සිහිපත් කරන්නේ ව්‍යවහාර මුදල අවප්‍රමානය වූ තරම යි. මුදල තමන්ට තිබූ සියලු වටිනාකම් නැති කර ගනිද්දී, පෞද්ගලික වෙලඳාම නීති විරෝධී බව ප්‍රකාශයට පත් කෙරින, ජනසතු කිරීම සියලු ව්‍යවසායන් විෂයෙහි ක්‍රියාත්මක වන්නට විය, සමාජවාදී ආර්ථිකයක් ස්ථාපනය වෙමින් පවතින බවට ද විශ්වාසයක් තිබින. සමානතාව මත පදනම්ව "කොමියුනිස්ට්වාදය" ස්ථාපනය කෙරුනු තාක් දුරට නිසැකව ම එය දුගී බවේ කොමියුනිස්ට්වාදයක් විය. එහෙත් යුද කොමියුනිස්ට්වාදී පියවරයන් දක්නා ලද්දේ සමාජවාදී ක්‍රමය කරා පිය මනින පඩි පෙලවල් වශයෙනි.

දිලිඳු භාවයට පත් රුසියාවේ දෘෂ්ටිකෝනයෙන් බලන විට එවැනි සංකල්ප මුලුමනින් ම අතාර්කික විය. එසේ නම් ඒවා මතු විය හැකි වූයේ කෙසේ ද? පිලිතුර පවතින්නේ ඒවා වර්ධනය වූයේ විප්ලවය සජීවීකරනය වූ ඉදිරි දර්ශනවල පදනම මත ය යන කරුනෙහි ය. එනම්, රුසියාවෙහි බලය ගැනීම යුරෝපා සමාජවාදී විප්ලවයට පූර්විකාවක් වන්නේ ය.

ට්‍රොට්ස්කි පසුව පැහැදිලි කල පරිදි, කම්කරු රාජ්‍යය මත යුද කොමියුනිස්ට්වාදය පනවා තිබුනු අවධියේ දී, කිසිදු ප්‍රධාන ආර්ථික නැම්මකින් තොරව ම එය සමාජවාදය කරා යොමු විය හැකි බවට කිසි යම් බලාපොරොත්තුවක් තිබින. මෙය පදනම් වූයේ බටහිර යුරෝපයේ විප්ලවවාදී වර්ධනය එය සිදු වූවාට වඩා වැඩි වේගයකින් එලඹෙනු ඇතැයි විශ්වාස කිරීම මත ය.

> "යුරෝපා කම්කරු පන්තිය 1919 දී බලය අත්පත් කර ගත්තේ නම්, ඔවුන් අපගේ පසුගාමී "ආර්ථික සහ සංස්කෘතික අර්ථයෙන් පසුගාමී" රට සමග හාදකම් ඇති කර ගන්නට ඉඩ තිබින; තාක්ෂනික වශයෙන් සහ සංවිධානමය වශයෙන් අපගේ පිහිටට එන්නට ඉඩ තිබින; ඒ අනුව අපගේ යුද කොමියුනිස්ට්වාදී විධික්‍රමය නිවැරදි කර ගනිමින් සහ වෙනස් කර ගනිමින් අව්‍යාජ සමාජවාදී ආර්ථිකයක දිශාවට සෘජුව ගමන් කිරීමට අපට හැකියාව ලැබෙන්නට ඉඩ තිබින. ඔව්, නිසැකව ම අපගේ බලාපොරොත්තු එබඳු විය. අපි කිසි විටෙකත් විප්ලවවාදී හැකියාවන් සහ ඉදිරි දර්ශනයන් අවම කිරීම මත අපගේ ප්‍රතිපත්තිය පදනම් නොකලෙමු. ඊට ප්‍රතිපක්ෂව, සජීව විප්ලවවාදී බලවේගයක් ලෙස අපි හැම විට ම මෙම හැකියාවන් පුලුල් කිරීමටත් සෑම කෙනෙකු ම අවසානය දක්වා ම පාවිච්චි කිරීමටත් පරිශ්‍රම දරා ඇත්තෙමු." [6]

යුරෝපා විප්ලවය ඉතා ඉක්මනින් දිග හැරේ ය යන අපේක්ෂාව දරා සිටි නමුත්, කම්කරු රාජ්‍යයට පීඩා පමුනුවන ආර්ථික බරබද්දල් ජය ගැනීම සඳහා සහන දීම්වල ස්වරූපයෙන් "මින් අදහස් වූයේ සෝවියට් රුසියාව තුල විදේශීය ආයෝජන මත පදනම් වූ ව්‍යාපාර ස්ථාපනය කිරීම යි" හෝ නයවල ස්වරූපයෙන් බටහිරින් කිසි ම සහායක් ඉල්ලා සිටීම පිලිබඳව ට්‍රොට්ස්කි කිසිදු බලාපොරොත්තුවක් නොතැබී ය. සැබවින් ම, රතු හමුදාවේ නායකයා ලෙස ට්‍රොට්ස්කි නිමග්නව සිටියේ අධිරාජ්‍යවාදීන්ගේ පිටුබලය ලද ප්‍රතිවිප්ලවය ආපසු හැරවීමේ දෛනික අරගලයෙහි ය.

මෙම ගැටලු සැලකිල්ලට ගැනීම ජෙෆ්රි ස්වේන්ගේ පරිපූර්න මුසාකරනයන් ද ස්වේන් පදනම් වී ගැනීමට උත්සාහ දරන ඉතිහාසඥ රිචඩ් ඩේගේ විශ්ලේෂනයෙහි එන නොපැහැදිලිකම් ද එලිදරව් කර ගැනීමට උපකාර වෙයි.

ස්වේන් සිය කෘතියේ පලමු පිටුවෙහි මෙසේ ලියයි:

> "ට්‍රොට්ස්කි ජාත්‍යන්තරවාදියෙකු වීම කෙසේ වෙතත් තනි රටක සමාජවාදය ගොඩ නැගීමට ඇති හැකියාව ගැන දැඩිව විශ්වාසය තබා සිටියේ යැයි වසර 30කටත් වැඩි කලකට පෙර ලියමින් රිචඩ් ඩේ ඒත්තු යන ආකාරයෙන් තර්ක කලේ ය." [7]

පලමුව, මෙය ඩේ ඇත්ත වශයෙන් ලියූ දෙය මුලුමනින් ම මුසාකරනය කිරීමකි. ඔහු ලියුවේ මෙය යි:

"ට්‍රොට්ස්කිට පැවති සක්‍රිය ප්‍රශ්නය වූයේ ජාත්‍යන්තර විප්ලවයට පෙර රුසියාවේ සමාජවාදය ගොඩ නැගිය හැකි ද නැද්ද යන්න නො ව, පවතින හා අනාගතයේ ඇති විය හැකි ජාත්‍යන්තර ශ්‍රම විභජනය සැලකිල්ලට ගනිමින් ප්‍රශස්ත සැලසුම්කරන මූලෝපායක් සොයා ගන්නේ කෙසේ ද යන්න යි." [8]

ඩේට අනුව, යුද කොමියුනිස්ට්වාදී කාල පරිච්ඡේදයේ දී බොල්ශේවික් පක්ෂය තුල ප්‍රවනතා දෙකක් මතු විය: එකක් නම් "විසංගමනවාදය" (හුදෙකලාවාදය) යි, අනෙක නම් "සමෝධානවාදය" යි. විසංගමනවාදීහු සෝවියට් රුසියාව ලෝක ආර්ථිකයෙන් පිටුවාහල් වූවක් ලෙස දැකීමට නැඹුරු වූ අතර සමෝධානවාදීහු රුසියාව ජාත්‍යන්තර කටයුතු තුල දී සිය තත්ත්වය නැවත ලබා ගත යුතු ය යන අදහස දැරූහ. ට්‍රොට්ස්කිගේ ආස්ථානය නොනවතින විප්ලවයේ ඉදිරි දර්ශනය පිලිබඳව කල සාමාන්‍ය අර්ථකථනයට අනුරූප වූයේ නම්, ඒ තාක් දුරට ට්‍රොට්ස්කි සමෝධානවාදී කන්ඩායමට වැටෙන්නට ඇතැයි ඩේ තව දුරටත් කියා සිටියේ ය.

"වඩා යහපත් විකල්පයක් වෙත ලඟා වීමේ වුවමනාව වෙනුවෙන්" ජාත්‍යන්තර වෙලඳාම ප්‍රකෘතිමත් වීම සහ ධනේශ්වර යුරෝපයෙන් විදේශීය ආයෝජන ලැබීම යන දෙක ම ඉටු කරන "විදේශීය ආර්ථික ආධාර ඉල්ලා සිටීම සඳහා හැකි සෑම උපක්‍රමයක් ම යෙදිය යුතු ය යන පලල්ව පිලිගත් මතයට ඔහු එකඟ වන්නට ඉඩ තිබුනි. නමුත් සාක්ෂිවලින් පෙන්නුම් කෙරෙන්නේ ඔහු සත්‍ය වශයෙන් ම ආර්ථික හුදෙකලා භාවයේ ප්‍රධාන න්‍යායවාදියා ලෙස ඉස්මතු වූ බව යි." [9]

එහෙත්, ට්‍රොට්ස්කිගේ ආස්ථානයෙහි ඩේ කියන්නාක් වැනි කිසිදු අස්ථාවර බවක් නො වී ය. බටහිරින් ලැබෙන ආර්ථික සහාය ගැන කිසිදු විශ්වාසයක් තැබිය නොහැකි බව ද සෝවියට් රුසියාවේ දුර්වල ආර්ථික තත්ත්වය නිසා "මිලිටරි මාධ්‍යයන්ගෙන් කිරීමට උත්සාහ කලා සේ ම" කම්කරු රාජ්‍යයට හානි කිරීමේ මාධ්‍යයක් ලෙස කිසි යම් ආර්ථික සහනයක් යොදා ගැනීමට එම අධිරාජ්‍යවාදී බලයන් උත්සාහ දරනු ඇතැයි ද ඔහු අවධාරනය කලේ ය.

1920 මුල දී රුසියාවට එරෙහිව මිත්‍ර පාක්ෂිකයන් පනවා තිබූ ආර්ථික සම්බාධක ඉවත් කෙරුනු විට ලෙනින් ආර්ථික ආධාර ලඟ ලඟ ම එනු ඇතැයි යන අපේක්ෂාව ඇති කර ගත්තේ ය. ට්‍රොට්ස්කි දැරුවේ වෙනස් මතයකි. ආර්ථිකය ප්‍රකෘතිමත් වන තුරු යටතේ යුරෝපය සමග ආර්ථික සම්බන්ධතා නැවත ස්ථාපනය වුව හොත් එය සමාජවාදය ගොඩ නැගීම උදෙසා වාසිදායක විය හැකි යැයි ඔහු 1920 පෙබරවාරියේ දී ලිවී ය. එහෙත් ඔහුට අනුව, ඒ තුල විය හැකි, වඩාත් විය හැකි, තවත් දෙයක් ද තිබිනි:

"අප තව දුරටත් ආර්ථික වශයෙන් පිරිහුන හොත්, වෙලඳ භාන්ඩ සැපයීම හිමි ලෝක වෙලෙන්දෝ අපට කොන්දේසි පනවනු ඇත. එක් ආකාරයකින් හෝ තවත් ආකාරයකින් ඔවුන් අප වහල් විජිත රටක් මට්ටමට පහත හෙලනු ඇත." [10]

වාම විරුද්ධ පාර්ශ්වයේ ආර්ථික ප්‍රතිපත්ති පිලිබඳව ලියූ පසු කාලීන ලිපියක රිචඩ් ඩේ සඳහන් කල පරිදි, "අවාසිදායක කොන්දේසි පැනවිය හැකි යැයි ද 'තේ රාත්තලකට සහ උකු කිරි ටින් එකකට' හුවමාරුවක් වශයෙන් සාර්ගේ නය පිලිගැනීමට බොල්ශේවිකයන්ට බල කල හැකි යැයි ද බියෙන්" ට්‍රොට්ස්කි "රුසියාව ප්‍රකෘතිමත් වීම පටන් ගන්නා තෙක් යුරෝපයත් සමග යලි සම්බන්ධකම් ඇති කර ගැනීමට අදිමදි කර තිබින." [11]

ට්‍රොට්ස්කිගේ අදහස තහවුරු විය: සහන සහ නය අතිශයින් ම සීමාසහිත වූ අතර කම්කරු රාජ්‍යයට හානි කිරීමේ එල්ලය ඇතිව ඒවාට කොන්දේසි ඈඳා තිබින. බ්‍රිතාන්‍යයේ භාරකාරත්වය යටතේ යුරෝපා ආර්ථිකය ප්‍රතිසංවිධානය කිරීම සඳහා ප්‍රයත්න දරනු වස් බ්‍රිතාන්‍ය අගමැති ලොයිඩ් ජෝර්ජ් 1922 අප්‍රේල් මාසයෙහි කැඳවූ ජෙනෝවා සම්මේලනයේ දී ජනසතුහරනය (යලි පෞද්ගලීකරනය කිරීම) සඳහාත් සාර්ගේ නය ආපසු ගෙවීම සඳහාත් අධිරාජ්‍යවාදී බලයන්ගෙන් ඉදිරිපත් වූ ඉල්ලීම් ඉතා බලවත් විය; නවතින්නට කාලය එලඹ ඇතැයි සම්මේලනය ඇරඹෙන්නටත් පෙර ම ලෙනින් දැඩිව කියා සිටියේ ය.

බටහිර යුරෝපයෙහි සමාජවාදී විප්ලවයේ වේගවත් වර්ධනයක් ඇති වීම ගැන බොල්ශේවිකයන්ට පැවති බලාපොරොත්තු නො තකා යුද කොමියුනිස්ට්වාදී ක්‍රියා මාර්ගය අසාර්ථක වන්නට නියමිත විය. ධාන්‍ය බලෙන් ලබා ගැනීමේ වැඩ පිලිවෙල අඩු ගනනේ යම් කලකට වත් රතු හමුදාවට ධාන්‍ය සැපයීම සුරක්ෂිත කලත්, මූලික ගැටලුව වූයේ කාර්මීකරනයේ ඉදිරි ගමන සඳහා අත්‍යවශ්‍ය වූ කෘෂිකාර්මික නිෂ්පාදන නගරයට සැපයීම සහතික කිරීමට ඊට නොහැකි වීම යි. සිවිල් යුද්ධය අතරතුර දී ගොවීන් බොල්ශේවිකයන්ගේ පැත්තට පැමින තිබුනේ ඉඩම් හිමියන් යලි පැමිනීම වැලැක්විය හැකි වන්නේ බොල්ශේවිකයන්ට පමනක් යැයි කටුක අත්දැකීම් ඔස්සේ වටහා ගනිමිනි. එහෙත් නව පාලනයේ ආර්ථික ප්‍රතිපත්තිවලට සහාය දීම තවත් ප්‍රශ්නයක් විය. ඔවුන් බොල්ශේවිකයන්ට සහාය දෙන අතර කොමියුනිස්ට්වාදීන්ට විරුද්ධ වී ය යන වැකිය තුල ගොවීන්ගේ ආකල්පය සංක්ෂිප්තව තිබින.

පවතින ප්‍රතිපත්තිය කාලයක් තිස්සේ පැවතී ගෙන යා හැකි නමුත් මූලික මට්ටමේ යලි දිශානතිගත වීමක් සිදු නො වුව හොත් අවසානයේ දී සමාජය බිඳ වැටීමකට මුහුන දෙන බව 1919 අග වන විට පැහැදිලි විය.

මේ දිසාවට වූ පලමු යෝජනාව පැමිනියේ 1920 මුල දී ට්‍රොට්ස්කිගෙනි. යූරල් ප්‍රදේශයෙහි සිටින අතරතුර තමන් කල නිරීක්ෂනයන් ප්‍රයෝජනයට ගනිමින් ඔහු ධාන්‍ය බලෙන් ලබා ගැනීමේ වැඩ පිලිවෙල අවසන් කර ඒ වෙනුවට කිසි යම් බදු ක්‍රමයක් යොදා ගැනීම සුදුසු යැයි යෝජනාවක් ඉදිරිපත් කලේ ය. මෙම යෝජනාව යටතේ, රාජ්‍යයට ධාන්‍ය සැපයීමට සිදු වී තිබුන ද ගොවියාට තම පෞද්ගලික පංගුව වැඩි දියුනු කර ගැනීමට හැකි විය. 1920 පෙබරවාරියේ දී ඔහු තම යෝජනාව මධ්‍යම කාරක සභාව වෙත ඉදිරිපත් කලේ ය.

> ඔහු මෙසේ ලිවී යඃ "ආහාර ප්‍රමානයට සමාන වන පරිදි බලෙන් ධාන්‍ය ලබා ගන්නා, බෙදා හැරීම සම්බන්ධයෙන් අන්‍යොන්‍යව වගකියන, එමෙන් ම නිෂ්පාදිත භාන්ඩ සමානව බෙදා හරින වත්මන් ප්‍රතිපත්තිය කෘෂිකර්මාන්තයේ තත්ත්වය පහත දැමීමට සහ කාර්මික කම්කරු පන්තිය විසුරුවා හැරීමට හේතු විය හැකි අතර, රටේ ආර්ථික ජීවිතය මුලුමනින් ම බිඳ දැමීමට තර්ජනය කරයි."
>
> "අවසන් වීමේ තර්ජනයට ද බලෙන් ලබා ගැනීමේ විධික්‍රම වලකා ලිය හැකි වන පමනට වැඩි දියුනුවක් සිදු වී නැතිකමෙන් මතු වන අවිනිශ්චිතතාවේ තර්ජනයට ද ආහාර සම්පත් මුහුන පා සිටී. ආර්ථික පරිහානිය කරා වන මෙම ප්‍රවනතා පහත සඳහන් ආකාරවලින් නවතා ලිය හැකි යඃ (1) අතිරික්තයන් බලෙන් ලබා ගැනීම, (ක්‍රමයෙන් වැඩි වන බද්දක් වැනි) ප්‍රතිශත පදනම මත ගෙවීමක් කිරීමේ ක්‍රමයකට මග පෑදිය යුතු ය; ගෙවීමේ ප්‍රමානය තීන්දු වන්නේ, සී සාන වපසරිය වැඩි කොට නැත හොත් වඩා වැඩිපුර වගා කොට යම් ලාභයක් උපයා ගනී නම් ඒ අනුව ය; (2) ගොවීන්ට සපයන කාර්මික නිෂ්පාදන සහ ඔවුන් බෙදා හරින ධාන්‍ය ප්‍රමානය අතර වඩා සමීප අනුරූපතාවක් තහවුරු විය යුතු ය; මෙය අදාල වන්නේ ග්‍රාමීය ප්‍රදේශවලට සහ ගම්මානවලට පමනක් නො වේ, තනි තනි ගොවි පවුල්වලට ද එය අදාල ය." [12]

කෙසේ වෙතත්, ලෙනින් මෙම යෝජනාවට විරුද්ධ වූ අතර මධ්‍යම කාරක සභාවේ දී එය 11ට 4ක් වශයෙන් පරාජයට පත් විය. 1920 මාර්තුවේ දී පක්ෂයේ නව වන සමුලුව පැවැත්විනි. ට්‍රොට්ස්කි එහි දී ප්‍රශ්නය මතු නොකලේ ය, එහෙත් ලෙනින් සමග සහයෝගීව යුද කොමියුනිස්ට්වාදී ප්‍රතිපත්ති වඩා තදබල ලෙස යොදා ගන්නා පියවරයන් ඉදිරිපත් කලේ ය.

සටහන්ඃ


1. Alec Nove, *An Economic History of the USSR* (ඇලෙක් නෝව්, "සෝවියට් සමාජවාදී සමූහාන්ඩු සංගමයේ ආර්ථික ඉතිහාසය ගැන"), Penguin, 1990, 42 පි.

2. Nove, 37 පි.

3. Nove, 75 පි.

4. Leon Trotsky, *The First Five Years of the Comintern* (ලියොන් ට්‍රොට්ස්කි, "කොමින්ටර්නයේ පලමු පස් වසර"), 2 වන වෙලුම, New Park, 1974, 227 පි.

5. Nove, 57 පි.

6. Trotsky, *The First Five Years of the Comintern*, 2 වන වෙලුම, 230 පිට.

7. Geoffrey Swain, *Trotsky*, (ජෙෆ්රි ස්වේන්, "ට්‍රොට්ස්කි"), Longman, 2006, 1 පි.

8. Richard Day, *Leon Trotsky and the Politics of Economic Isolation* (රිචඩ් ඩේ, "ලියොන් ට්‍රොට්ස්කි සහ ආර්ථික විසංගමනවාදී දේශපාලනය), Cambridge University Press, 2004, 4 පි.

9. Day, 5 පි.

10. Day, 27 පි.

11. Richard Day, *Studies in Comparative Communism* ("තුලනාත්මක කොමියුනිස්ට්වාදය පිලිබඳ අධ්‍යයන") කෘතියෙහි එන "Trotsky and Preobrazhensky: The Troubled Unity of the Left Opposition" ("ට්‍රොට්ස්කි සහ ප්‍රියෝබ්‍රෙෂෙන්ස්කිඃ වාම විරුද්ධ පාර්ශ්වයේ විපතට පත් එකමුතුව"), 1977, 73 පි.

12. Leon Trotsky, *My Life* (ලියොන් ට්‍රොට්ස්කි, "මගේ ජීවිතය") Penguin, 1988, 482 පි.


© www.wsws.org